# ශ්‍රී ලාංකීය දේශපාලන සන්දර්භය තුළ බලපෑම් කණ්ඩායමක් වශයෙන් බෞද්ධ භික්ෂූන්ගේ දේශපාලන සහභාගීත්වය : සමාජ විද්‍යාත්මක කියවීමක්

කේ.කේ.එච්.පවිත්‍රා[1](hirupavi123@gmail.com)

**සාරසංක්ෂේපය**

ප්‍රාග් ඓතිහාසික සමාජ ක්‍රමයේ සිට නූතන සංකීර්ණ සමාජ ක්‍රමය දක්වා විකාශනය වූ සමාජ සංස්ථා ඔස්සේ සමාජගත පුද්ගලයාගේ විවිධාකාර වූ අපේක්ෂාවන් සහ අවශ්‍යතාවයන් සපුරා ගැනීම අරමුණු කෙරිණි. අතීතයේ සිටම, එවැනි සමාජ සංස්ථාවන් අතරින් ආගමික සංස්ථාවට සුවිශේෂී ස්ථානයක් හිමිව තිබේ. ඒ අනුව අතීත සමාජ අවධීන්හි සිටම පෙර අපර දෙදිග රාජ්‍යයන්හි ආගම සහ දේශපාලනය අතර සුවිශේෂී වූ අන්තර් සබඳතාවයක් පැවතුන බව පෙන්වාදිය හැකිය. ක්‍රිස්තියානි, ඉස්ලාම්, බුදුදහම, සින්තෝ, කොන්ෆියුසියස් සහ හින්දු වැනි ආගම් සම්බන්ධ ඉතිහාසය විමර්ශනයෙන් එය මනාව තහවුරු වේ. නිදසුන් ලෙස බෞද්ධ සාහිත්‍ය තුළ දේශපාලන ප්‍රපංචය පිළිබඳව පවතින සාකච්ඡාවන් පෙන්වාදිය හැකිය. මෙහිදී රාජ්‍යත්වය සහ රාජ්‍යය යන සංකල්පයන් පිළිබඳව බෞද්ධ දේශපාලන දර්ශනය තුළ ඍජුව කරුණු පෙන්වා දී නැතිමුත්, යහපත් ලෙස රාජ්‍යය පාලනය පවත්වාගෙන යෑම සඳහා පාලකයෙකු තුළ පැවතිය යුතු ගුණ සමුදායන් පිළිබඳව, බුදුරජාණන් වහන්සේ විසින් චක්කවත්ති සීහනාද, මහා පරිනිබ්බාන, කූටදන්ත, මහා සුදස්සන හා බාල පණ්ඩිතාදී සූත්‍ර දේශනාවන් ඔස්සේ පැහැදිළි කර තිබෙන ආකාරය හඳුනාගත හැකිය. විශේෂයෙන්ම නූතන ලොව සෑම රාජ්‍යයකම දේශපාලන අධිකාරයන්ගේ ක්‍රියාකාරීත්වයට ආගමික සංස්ථාව විසින් බලපෑම් සිදු කරනු ලබයි. එමෙන්ම දේශපාලන අධිකාරයන්ද ස්වකීය දේශපාලන අභිමතාර්ථයන් සාධනය කර ගැනීම උදෙසා ආගමික සංස්ථාවන් භාවිතා කරන ආකාරයක්ද දක්නට ලැබේ. ශ්‍රී ලංකාව බහු ආගමික සහ බහු වාර්ගික රාජ්‍යයක් වන අතර, මෙම බහු ආගමික ස්වරූපය ආගම සහ දේශපාලනය යන සමාජ සංස්ථා දෙක අතර අන්තර් සබඳතාව වර්ධනය වීමට හේතු සාධක වී තිබේ. මෙරට සමස්ත ජනගහනයෙන් බහුතරය බෞද්ධයෝ වන අතර ඊට අමතරව හින්දු, ඉස්ලාම් සහ ක්‍රිස්තියානි ආගමිකයෝ ද සිටින බව ඓතිහාසික මූලාශ්‍ර වලින් තහවුරු වේ. බහුතරය බෞද්ධයින් වීම නිසා අතීත රාජාණ්ඩු පාලන රටාවන්ගේ සිටම, බෞද්ධ භික්ෂූන්ගේ දේශපාලන සහභාගීත්වය ලාංකික දේශපාලන ප්‍රවාහය තුළ කැපී පෙනෙන ලෙස ඉස්මතු වී ඇත. රාජාණ්ඩු පාලන සමය තුළ බොහෝ දුරට, රාජ්‍යත්වය සඳහා අවශ්‍ය උපදෙස් ලබාදෙන අනුශාසක තනතුරට පමණක් සීමාවූ බෞද්ධ භික්ෂූන්ගේ භූමිකාව වර්තමානය වන විට දේශපාලන ක්ෂේත්‍රය තුළ ඍජුවම බලපෑම් ඇති කරනු ලබන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ භූමිකාව දක්වා පරිවර්තනය වී තිබෙන ආකාරයක් පැහැදිළිවම හඳුනාගත හැකිය. නමුත් නිදහස ලැබීමෙන් පසුව ශ්‍රී ලංකාව මුහුණ දුන් ප්‍රධානතම අභියෝගයක් වන ජාතිය ගොඩනැගීමේ අභියෝගය වර්තමානය වන විටත් නොවිසඳී තිබීම සඳහා දේශපාලනීකරණය වූ භික්ෂුවගේ බලපෑමක් තිබේද යන්න පිළිබඳව මෙහිලා අවධානයට ලක් කරනු ලබයි. වර්තමාන ශ්‍රී ලාංකීය සමාජය තුළ සමාජ, සංස්කෘතික සහ ආර්ථිකමය වශයෙන් භික්ෂු දේශපාලනය ප්‍රායෝගීකරණය වී ඇති ආකාරය පිළිබඳවත්, ශ්‍රී ලාංකීය දේශපාලන සන්දර්භය තුළ බලපෑම් කණ්ඩායමක් වශයෙන් බෞද්ධ භික්ෂූන්ගේ දේශපාලන සහභාගීත්වය පිළිබඳවත්, උක්ත තේමාව හා සමපාත වන සාහිත්‍යය විෂයෙහි අවධානය යොමු කරමින් විග්‍රහය සිදු කරන ලදි.

*මූල පද : බලපෑම් කණ්ඩායම්, දේශපාලන සහභාගීත්වය, දේශපාලන භික්ෂුව, භික්ෂු දේශපාලනය*

**1 ස්වාධීන පර්යේෂක : ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ විද්‍යාව (ගෞරව) කොළඹ විශ්වවිද්‍යාලය, ශාස්ත්‍රපති උපාධි අපේක්ෂක (සමාජ විද්‍යාව) කොළඹ විශ්වවිද්‍යාලය**

## 1. හැඳින්වීම

ගතික සමාජ ප්‍රපංචයක් වන දේශපාලනය තුළ ආගම යනු සුවිශේෂී භූමිකාවක් නිරූපණය කරනු ලබන සමාජ සංස්ථාවකි. ඓතිහාසික සමාජ අවධීන් වල සිටම ආගමික සංස්ථාව සහ දේශපාලන සංස්ථාව අතර සුවිශේෂී අන්තර් සබඳතාවක් පැවති බව ක්‍රිස්තියානි, ඉස්ලාම්, බුදු දහම, සින්තෝ, කොන්ෆියුසියස් සහ හින්දු වැනි ආගම් හා සම්බන්ධ ඉතිහාසය විමර්ශනය කිරීමේදී තහවුරු වේ. නිදසුන් ලෙස බෞද්ධ සාහිත්‍ය තුළ දේශපාලන ප්‍රපංචය පිළිබඳව පවතින සාකච්ඡාවන් පෙන්වාදිය හැකිය. මෙහිදී රාජ්‍යත්වය සහ රාජ්‍යය යන සංකල්පයන් පිළිබඳව බෞද්ධ දේශපාලන දර්ශනය තුළ ඍජුව කරුණු පෙන්වා දී නැතිමුත්, යහපත් ලෙස රාජ්‍යය පාලනය පවත්වාගෙන යෑම සඳහා පාලකයෙකු තුළ පැවතිය යුතු ගුණ සමුදායන් පිළිබඳව, බුදුරජාණන් වහන්සේ විසින් චක්කවත්ති සීහනාද, මහා පරිනිබ්බාන, කුටදන්ත, මහා සුදස්සන හා බාල පණ්ඩිතාදී සූත්‍ර දේශනාවන් ඔස්සේ පැහැදිළි කර තිබෙන ආකාරය හඳුනාගත හැකිය.

බෞද්ධ සාහිත්‍ය විමර්ශනයේදී පැහැදිලිවම විද්‍යමාන වන සාධකයක් ලෙස බුදුරජාණන් වහන්සේ සහ සමකාලීන රාජ්‍ය පාලකයින් අතර පැවති සබඳතාව පෙන්වාදිය හැකිය. ඒ අනුව බුදුරජාණන් වහන්සේ තත්කාලීන රාජ්‍ය පාලකයින් වූ කොසොල්, බිම්බිසාර, ශාක්‍යයන් සහ ලිච්ඡවි රජ දරුවන් සමඟ ඉතා සමීප සබඳතාවක් පවත්වාගෙන ගිය බවට බෞද්ධ සාහිත්‍ය සාක්ෂි සපයයි. මෙම රජ දරුවන් බුදුරදුන්ගේ දායකයින් වූ අතර නිතරම බුදුරදුන්ගේ අවවාද අනුශාසනා ලබමින් රාජ්‍ය පාලන කටයුතු සිදු කල බව බෞද්ධ සාහිත්‍යයේ සඳහන් වේ. මෙම අන්‍යෝන්‍ය සබඳතාව නිසාම, බුදුරජාණන් වහන්සේ විසින් රජුට අවනත වන ලෙස සංඝයාට අවවාද කරමින්, රජු යටතේ සේවය කරන්නන් හෝ අධිකරණ නිළධාරීන් සසුන්ගත කිරීම විනය පිටකයේ නීති තුළින්ම තහනම් කල අතර රජවරුන්ද භික්ෂූන් වහන්සේලා සම්බන්ධයෙන් එවැනිම සුවිශේෂී සැළකිල්ලක් දැක්වූහ. බිම්බිසාර රජු විසින් භික්ෂූන් වහන්සේලා දඬුවම් වලින් නිදහස් කල බව ප්‍රකාශ කිරීමෙන්ම ඒ බව මනාව තහවුරු වේ. මේ අනුව බෞද්ධ භික්ෂූන් වහන්සේලා සහ දේශපාලන සංස්ථාව අතර සබඳතාව බුද්ධකාලීන සමාජ අවධියෙහි සිටම පැවත එන්නක් බව පෙන්වාදිය හැකිය.

විශේෂයෙන්ම නූතන කාර්මික ලෝකය තුළද සෑම රාජ්‍යයකම දේශපාලන අධිකාරයන්ගේ ක්‍රියාකාරීත්වයට ආගමික සංස්ථාව විසින් බලපෑම් සිදු කරනු ලබයි. එමෙන්ම දේශපාලන අධිකාරයන්ද ස්වකීය දේශපාලන අභිමතාර්ථයන් සාධනය කර ගැනීම උදෙසා ආගමික සංස්ථාවන් භාවිතා කරන ආකාරයක්ද දක්නට ලැබේ. මේ අනුව ආසියාතික සමාජයක් වන ශ්‍රී ලාංකේය සමාජය තුළද, ආගම හා දේශපාලනය එකිනෙකින් වෙන්කළ නොහැකි ලෙස අවියෝජනීය සහසම්බන්ධතාවකින් බැඳී පවතින ආකාරය හඳුනාගත හැකිය. ශ්‍රී ලංකාව බහු ආගමික සහ බහු වාර්ගික රාජ්‍යයක් වන අතර, මෙම බහු ආගමික ස්වරූපය ආගම සහ දේශපාලනය යන සමාජ සංස්ථා දෙක අතර අන්තර් සබඳතාව වර්ධනය වීමට හේතු සාධක වී තිබේ. මෙරට සමස්ත ජනගහනයෙන් බහුතරය බෞද්ධයෝ වන අතර ඊට අමතරව හින්දු, ඉස්ලාම් සහ ක්‍රිස්තියානි ආගමිකයෝ ද සිටින බව ඓතිහාසික මූලාශ්‍ර වලින් තහවුරු වේ. බහුතරය බෞද්ධයින් වීම නිසා අතීත රාජාණ්ඩු පාලන රටාවන්ගේ සිටම, බෞද්ධ භික්ෂූන්ගේ දේශපාලන සහභාගීත්වය ලාංකික දේශපාලන ප්‍රවාහය තුළ කැපී පෙනෙන ලෙස ඉස්මතු වී ඇත.

ඓතිහාසික වශයෙන් විමසා බැලීමේදී ශ්‍රී ලාංකික දේශපාලන ක්ෂේත්‍රය විවිධ සමාජයීය, ආර්ථික, ආගමික සහ ප්‍රාදේශීය සාධක සමඟ බැඳී පවතින ආකාරයක් හඳුනාගත හැකි අතර, එය නව සමාජ ප්‍රවාහ හා පැරණි සමාජ බලවේගයන් මඟින් බලපෑමට ලක් වෙමින් ලාංකික මහජන අවකාශය කෙරෙහි ඇති කරන බලපෑම කුමන ස්වරූපයක් ගනීද යන්න අවධානයට ලක් කල යුතුම සංසිද්ධියක් වේ. විශේෂයෙන්ම යටත්විජිතවාදය සමඟ ඇතිවූ නව සමාජ වෙනස්කම් මෙන්ම, දේශපාලනික ප්‍රතිසංස්කරණයන් හමුවේ විවිධ බලපෑම් කණ්ඩායම් ශ්‍රී ලංකාව තුළද තම බලාධිපත්‍යය පැතිරවීම සිදු කරන ලදී. එහිදී මහජන අවකාශය වෙතට බලපෑම් කරනු ලබන ප්‍රධාන බලපෑම් කණ්ඩායමක් වශයෙන් බෞද්ධ භික්ෂු කණ්ඩායම් ද ක්‍රියාත්මක වී ඇත.

ඒ අනුව ශ්‍රී ලාංකීය දේශපාලන සන්දර්භය තුළ බලපෑම් කණ්ඩායමක් වශයෙන් බෞද්ධ භික්ෂූන්ගේ දේශපාලනික සහභාගීත්වය අධ්‍යයනය කිරීමේ මෙම පර්යේෂණය සඳහා උපයුක්ත කරගත් පර්යේෂණ ගැටලුව වන්නේ, "ශ්‍රී ලාංකීය දේශපාලන සන්දර්භය තුළ බලපෑම් කණ්ඩායමක් වශයෙන් බෞද්ධ භික්ෂූන්ගේ භූමිකාව කෙබඳු ආකාර වන්නේද?" යන්නයි. එහිලා, මෙහි ප්‍රධාන පර්යේෂණ අරමුණ වන්නේ, ශ්‍රී ලාංකීය දේශපාලන සන්දර්භය තුළ බලපෑම් කණ්ඩායමක් වශයෙන් බෞද්ධ භික්ෂූන්ගේ භූමිකාව විග්‍රහ කිරීමයි. ඒ හා සමගාමීව ගොඩනගාගත් පර්යේෂණ උප අරමුණු පහත පරිදි පෙන්වාදිය හැකිය.

- ශ්‍රී ලාංකික දේශපාලන සන්දර්භය තුළ දේශපාලනීකරණය වූ බෞද්ධ භික්ෂුවගේ භූමිකාව විශ්ලේෂණය කිරීම
- ශ්‍රී ලාංකික දේශපාලන අවකාශය තුළ මහජන මතයන් නිර්මාණය කිරීම සඳහා බෞද්ධ භික්ෂු කණ්ඩායම් මඟින් ඇති කරන බලපෑම විග්‍රහ කිරීම.
- බහු වාර්ගික සමාජයක් වන ශ්‍රී ලංකාව තුළ පවතින ජාතිය ගොඩනැගීමේ අභියෝගය ජය ගැනීම සඳහා දේශපාලනීකරණය වූ බෞද්ධ භික්ෂූන්ගේ ක්‍රියාකාරකම් කොතරම් දුරට ප්‍රයෝජනවත් වන්නේදැයි හඳුනා ගැනීම.

**2. පර්යේෂණ ක්‍රමවේදය**

ප්‍රාථමික දත්ත එක් රැස් කිරීම සඳහා ප්‍රජාවකින් සමන්විත නියැදියක් උපයුක්ත කර ගැනීම ප්‍රායෝගිකව වැදගත් විය හැකි නමුත්, මෙම අධ්‍යයනය සාර්ව තලයේ දේශපාලන ක්ෂේත්‍රය ඉලක්ක කරගත්තක් බැවින්, කුඩා නියැදියකින් එක්රැස් කරගත් දත්ත සාර්ව තලයට සාමාන්‍යකරණය කිරීමට යෑම ගැටලු සහගත වීමේ සම්භාවිතාව ඉතා ඉහළ මට්ටමක පවතී. එකී සීමාව කරණ කොටගෙන, ද්විතීයික දත්ත මත පදනම්ව පර්යේෂණය ක්‍රියාත්මක කරන ලදි. ඒ අනුව ශාස්ත්‍රීය ග්‍රන්ථ, ලිපි, පරිවර්තන මෙන්ම පළ කළ සහ පළ නොකරන ලද ශාස්ත්‍රීය නිබන්ධ යන ද්විතීයික මූලාශ්‍රයන්හි ලේඛනගත දත්ත උපයුක්ත කරගන්නා ලදි.

**3. සාහිත්‍යය විමර්ශනය**

**3.1. දේශපාලන සහභාගීත්වය, බලපෑම් කණ්ඩායම් සහ භික්ෂු දේශපාලනය යනු,**

යථෝක්ත තේමාව සමාජ විද්‍යාත්මකව විග්‍රහ කිරීම සඳහා මූලික වශයෙන්ම තේමාව තුළ අන්තර්ගත දේශපාලන සහභාගීත්වය, බලපෑම් කණ්ඩායම් සහ භික්ෂු දේශපාලනය යන ප්‍රධාන

සංකල්පයන් පැහැදිළිව හඳුනා ගැනීම වැදගත් වේ. එහෙයින් මෙකී සාකච්ඡාවට ප්‍රවිශ්ඨ වීමට මත්තෙන් එම සංකල්ප ත්‍රිත්වය විෂයෙහි සරල අර්ථගැන්වීමක් මූලිකවම සිදු කෙරේ.

දේශපාලන විග්‍රහවල දී දේශපාලන චින්තකයින් පිළිගන්නා ආකාරයට නූතන ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රියාවලියේ යහපැවැත්ම සඳහා ප්‍රජා සහභාගිත්වය අත්‍යාවශ්‍ය අංගයක් වේ. දේශපාලන සහභාගිත්වය යනු හුදු ඡන්දය ප්‍රකාශ කිරීම පමණක් නොවේ. රාජ්‍යයේ පුරවැසියෙකු වශයෙන් මහජන මතය නිර්මාණය කිරීමට, පාර්ශවකරුවෙකු වශයෙන් තීරණ ගැනීමේ ක්‍රියාවලියට සම්බන්ධ වීමට සහ බලපෑම් කණ්ඩායමක් වශයෙන් ක්‍රියා කිරීම වැනි අංගයන් දේශපාලන සහභාගිත්වය මඟින් නිර්වචනය කෙරේ. ඒ අනුව දේශපාලන සහභාගිත්වය ඍජු හෝ වක්‍ර ක්‍රියාවලියක් විය හැකිය. දේශපාලන සහභාගිත්වය මඟින් අපේක්ෂා කරන්නේ පාලකයින් තෝරා ගැනීම, පාලකයින් ඉවත් කිරීම, මහජන අවශ්‍යතා පාලන තන්ත්‍රයට දැනුම් දීම, බලපෑම් කිරීම, මහජන මතයන් නිර්මාණය කිරීම සහ පාලන තන්ත්‍රයට අනුග්‍රාහකත්වය දැක්වීම හෝ විරෝධතාව ප්‍රකාශ කිරීමයි (Almond, 1992).

දේශපාලන බලපෑම් කණ්ඩායමක් යනු පවතින දේශපාලන ප්‍රවාහය තුළ වෙනසක් සිදු කිරීමට අපේක්ෂා කරමින්, ඒ වෙනුවෙන් අදාළ දේශපාලන ප්‍රවාහය මත තම බලපෑම යොදන කණ්ඩායමක් ලෙස සරලව අර්ථගැන්විය හැකිය. ඒ අනුව ශ්‍රී ලාංකීය දේශපාලන ක්ෂේත්‍රය තුළ බලපෑම් කණ්ඩායමක් වශයෙන් බෞද්ධ භික්ෂූන්ගේ දේශපාලන සහභාගීත්වය පිළිබඳව අදාළ සාහිත්‍ය ඇසුරින් සාකච්ඡා කරනු ලැබේ.

මෙරටට සර්වජන ඡන්ද බලය 1928 ඩොනමෝර් කොමිසමේ නිර්දේශයන් මත 1931 දී හිමි විය. මෙසේ සර්වජන ඡන්ද බලය හිමි වීමත් සමඟ බෞද්ධ භික්ෂුවගේ දේශපාලන සබඳතා ක්‍රමයෙන් වර්ධනය විය. එනම් භික්ෂුව රාජ්‍ය මන්ත්‍රණ සභා මැතිවරණ සඳහා ඉදිරිපත් නොවූවද වක්‍රාකාරයෙන් මැතිවරණ දේශපාලනය හා සම්බන්ධ වී ඇත. 1931 රාජ්‍ය මන්ත්‍රණ සභා මැතිවරණයට ඉදිරිපත් වූ බොහෝ අපේක්ෂකයින් ඉංග්‍රීසි සංස්කෘතිය තුළ හැදී වැඩුණු, ඉංග්‍රීසි කතා කරන සහ සාමාන්‍ය පොදු ජනතාවගෙන් දුරස් වූ ප්‍රභූ පිරිසක් වූහ. නමුත් මොවුන්ට අවශ්‍යය දේශපාලන බලය ලබා ගැනීම සඳහා බහුතර සාමාන්‍ය ජනතාවගේ ඡන්දය ලබා ගැනීම අත්‍යාවශ්‍යය කරුණක් විය. එම කාර්යයේදී ඔවුන් සාමාන්‍ය ජනතාවට ළඟාවීම සඳහා භික්ෂුව අතරමැදියෙකු ලෙස භාවිතා කරන ලදි. මෙහිදී ප්‍රදේශයේ විහාරස්ථානයේ භික්ෂුවට තිබූ ගෞරවය මත, භික්ෂුව සමඟ සබඳතා පැවැත්වූ ප්‍රභූ අපේක්ෂකයින්ට ජනතාව සිය ඡන්දය ලබා දෙන ලදි (අයිවන්, 2006).

"භික්ෂු දේශපාලනය" (Monks Politics) සහ "දේශපාලන භික්ෂුව" (Political Monk) යන පදයන් මහත් ආන්දෝලනයකට ලක්වීම 1948 වර්ෂයේ සිට ආරම්භ විය (Thambiah, 1992). බලංගොඩ ආනන්ද මෛත්‍රී හිමි, නාරවිල ධම්මරතන හිමි, උඩකැන්දාවල සරණංකර හිමි සහ වල්පොළ රාහුල හිමි වැනි භික්ෂූන් තුළ පැවති වාමාංශික නැඹුරුව ඩී. එස්. සේනානායකගේ කෝපයට හේතු විය. 1946 ජනවාරි මස පැවති ප්‍රසිද්ධ දේශපාලන රැස්වීම් වලදී ඩී. එස්. සේනානායක මහතා විසින් වාමාංශික දේශපාලනයේ නිරත එම භික්ෂූන් ප්‍රසිද්ධියේ විවේචනය කරන ලදි (අයිවන්, 2007). මේ අනුව අතීතයේ සිටම ශ්‍රී ලංකාවේ දේශපාලන ක්ෂේත්‍රය තුළ බලපෑම් කණ්ඩායමක් වශයෙන් බෞද්ධ භික්ෂූන් වහන්සේලා ක්‍රියාත්මක වී ඇති ආකාරය හඳුනාගත හැකිය. එහිදී වඩාත් වැදගත් කරුණක්

ලෙස පෙන්වා දිය හැක්කේ ශ්‍රී ලංකාව යටත්විජිතවාදී බැම්මෙන් නිදහස ලබා ගැනීමත් සමඟ මුහුණ දුන් ප්‍රධානතම අභියෝගයන් දෙක වන ජාතිය ගොඩනැගීම සහ සමාජ, ආර්ථික, දේශපාලන, සංස්කෘතික වශයෙන් රට සංවර්ධනය කිරීමේ අභියෝගයන් වත්මන් දශකය වන විටද ජයගත නොහැකි වූ අභියෝගයන් ලෙසින් අප ඉදිරියේ පැවතීමයි. මේ සඳහා ශ්‍රී ලංකාවේ දේශපාලන ක්ෂේත්‍රය සහ ආගමික සංස්ථාව අතර පවතින අන්තර් සබඳතාව ඍජුව මෙන්ම වක්‍ර ලෙස සිදු කළ බලපෑම් ලාංකීය දේශපාලන ඉතිහාසය අධ්‍යයනය කිරීමේදී මැනවින් හඳුනාගත හැකිය.

**3.2. ආගම, දේශපාලනය සහ ශ්‍රී ලංකා සමාජය**

ශ්‍රී ලංකාවේ ආගම සහ දේශපාලනය යන සමාජ සංස්ථා දෙක අන්තර් සබඳතාවක් සහිතව ක්‍රියා කරනු ලබන බව ඉහත සාකච්ඡාව ඔස්සේ ගම්‍ය විය. මෙහිදී විශේෂයෙන්ම සැළකිල්ලට ගතයුතු සාධකයක් වන්නේ ශ්‍රී ලංකාව බහු වාර්ගික සහ බහු ආගමික රාජ්‍යයක් වීමයි. ආගමික වශයෙන් ගත් කල මෙරට ජනගහනයෙන් බහුතරය බෞද්ධයෝ වෙති. බෞද්ධයන්ට අමතරව හින්දු, ඉස්ලාම් සහ ක්‍රිස්තියානි ආගමිකයෝද ශ්‍රී ලංකාව තුළ ජීවත් වෙති. ශ්‍රී ලංකාවේ ආගමික විවිධත්වය පිළිබඳව පහත වගුව ඇසුරින් පෙන්වා දිය හැකිය.

**වගු අංක 01**

**ශ්‍රී ලංකාවේ ආගමික විවිධත්වය**

| ආගම | ප්‍රතිශතය (%) |
|---|---|
| බෞද්ධ | 70.1% |
| හින්දු | 12.6% |
| ඉස්ලාම් | 9.7% |
| ක්‍රිස්තියානි | 6.2% |

**(Source: Department of Census and Statistics, 2011)**

ශ්‍රී ලංකාවේ සමස්ත ජනගහනයෙන් බහුතරය බෞද්ධයන් විසින් නියෝජනය කරනු ලබන බවත් ශ්‍රී ලංකාව බහු ආගමික රාජ්‍යයක් බවත් ඉහත වගුවට අනුව පෙන්වා දිය හැකිය. ඒ අනුව ශ්‍රී ලංකාවේ සමාජ ව්‍යුහය ඇසුරින් මෙම තත්වය විග්‍රහ කිරීම වඩාත් සුදුසු වනු ඇත. ආගම පිළිබඳව ඉදිරිපත්ව ඇති බොහෝ අර්ථකථනයන් තුළ සමාජ ව්‍යුහය සහ ආගම අතර පවතින අන්තර් සබඳතාව පිළිබඳව විග්‍රහ කරනු ලබයි. එමෙන්ම වර්තමාන සංකීර්ණ ලෝක ක්‍රමය තුළ ආගමික පරිසරයෙන් බැහැරව මිනිසුන්ට ක්‍රියාකළ නොහැකිය (අමරසේකර සහ දසනායක, 2004). ශ්‍රී ලංකාව බහු වාර්ගික හා බහු ආගමික සමාජයක් වූ නමුත් සියලුම වාර්ගික සහ ආගමික කණ්ඩායම් කිසිදු භේදයකින් තොරව ජීවත් වූ බව ඓතිහාසික මූලාශ්‍ර වලින් තහවුරු වේ. නමුත් වර්තමානය වන විට ආගමික සහ වාර්ගික සාධකයන් පදනම් කරගෙන ගැටුම් වර්ධනය වීමක් දැකගත හැකිය. එම ගැටුම් සඳහා බලපෑම් කල ප්‍රධානතම සාධකය වශයෙන් දැක්විය හැක්කේ සමකාලීන ශ්‍රී ලාංකීය සමාජය තුළ දක්නට ලැබෙන ආගමික සහ දේශපාලන අධිකාරීන්ගේ අන්තගාමී මිශ්‍ර වීමයි.

යටත්විජිත පාලන සමය තුළ පාලන කටයුතු පහසු කර ගැනීම සඳහා ආගම යොදා ගැනීම පසුකාලීනව ආගම සහ දේශපාලනය අතර අනිසි සබඳතා ගොඩනැගීමට බලපාන ලදී. ජනවාර්ගික

සහ ආගමික සංකල්පයන් මහජන බල මණ්ඩලය තුළට ගෙනගොස්, එය පෘථුල ලෙස දේශපාලනය සමඟ යොදාගන්නා ආකාරයක් යටත්විජිත යුගයේදී දක්නට ලැබේ. 1815, 1818 සහ 1848 යන වර්ෂයන් තුළ ඉංග්‍රීසි විරෝධී නිදහස් සටන් පැවතුණු නමුත් පසුකාලීනව අධිරාජ්‍යය විරෝධී සටන් සඳහා නොව තමන් නියෝජනය කරනු ලබන ආගමික සහ වාර්ගික කණ්ඩායම් වල බලය වැඩි කර ගැනීම සඳහා පමණක් විරෝධතා මතු වූ අයුරු ශ්‍රී ලාංකික යටත්විජිත ඉතිහාසය ඇසුරින් පෙනී යයි (නමසිවායම්,2005).

ජනවාර්ගිකත්වය සහ ආගම දේශපාලන ක්‍රියාවලිය වෙත එළඹීම හේතුවෙන් පසමිතුරු දේශපාලනය ආරම්භ වූ අතර, මෙම පසමිතුරු දේශපාලනය වර්ධනය වීම සඳහා දේශීය පුනර්ජීවන ව්‍යාපාර විසින් දැඩි බලපෑමක් සිදු කරන ලදී. මිෂනාරි පාසල් වලට විරුද්ධව යමින් දේශීය ආගම්, සංස්කෘතිය, වාර්ගිකත්වය මත පදනම්ව ඇරඹි පාසල්, ඉරුදින දහම් පාසල්, තරුණ තරුණියන් සඳහා වූ සමිති සහ පුවත්පත් ආරම්භය වැනි ක්‍රියා පුනර්ජීවන ව්‍යාපාරයේ ප්‍රධානතම ආයතනයන් වී ඇත (Jayawardena, 1986). මෙම අවධිය තුළ මිෂනාරි ආගමික ප්‍රතිසංස්කරණ වලට එරෙහිව නැඟී සිටි බෞද්ධ භික්ෂූන්ගේ කාර්යභාරය දේශපාලනික ස්වරූපයක් ගනු ලැබුවත්, එය නූතන දේශපාලනීකරණය වූ කාර්යභාරයෙන් වෙනස් විය (Thambiah, 1992). ඒ අනුව ආගම සහ දේශපාලනය අතර පවතින සබඳතාව පිළිබඳව ශ්‍රී ලාංකීය අත්දැකීම් ඇසුරින් විශ්ලේෂණය කිරීමේදී, බෞද්ධ භික්ෂූන්ගේ දේශපාලන සහභාගීත්වය කාලීන සමාජ ප්‍රවාහයන් සමඟ වෙනස් වීමට ලක් වූ ආකාරය පිළිබඳව අවධානය යොමු කිරීම ඉතාමත් වැදගත් වේ.

### 04. සොයාගැනීම් සහ සාකච්ඡාව

දේශපාලන සංස්ථාව සහ ආගම අතර පවතින සබඳතාව පිළිබඳව විමසීමේදී, එම සබඳතාවය අවියෝජනීය සහසම්බන්ධතාවයකින් යුතුව ක්‍රියාත්මක වන ආකාරයක් හඳුනාගත හැකිය. විශේෂයෙන්ම ආගමික සංස්ථාව නූතන ලොව සෑම රාජ්‍යයකම දේශපාලන අධිකාරයන්ගේ ක්‍රියාකාරීත්වයට විවිධාකාර ලෙසින් බලපෑම් එල්ල කරන ආකාරයක් දක්නට ලැබේ. අනෙක් අතට දේශපාලන අධිකාරයන්ද ස්වකීය දේශපාලන අභිමතාර්ථයන් සාධනය කර ගැනීම සඳහා ආගමික සංස්ථාවන් උපයෝගී කරගන්නා ආකාරයක්ද දක්නට ලැබේ. මෙම තත්ත්වය තුළ නූතන ලොව සෑම රාජ්‍යයක් තුළම ආගම සහ දේශපාලනය අතර මනා අන්තර් සම්බන්ධතාවයක් ගොඩනැඟී ඇත (හඳරාගම, 2014:122). ශ්‍රී ලංකාවේ භික්ෂු දේශපාලනයේ ස්වභාවය හඳුනාගැනීමේදී ඒ සඳහා එළඹුමක් වශයෙන් ලොව අනෙකුත් රාජ්‍යයන් කිහිපයක ආගමික සංස්ථාව සහ දේශපාලන සංස්ථාව අතර පවතින සබඳතාව කෙබඳු ආකාර වේදැයි හඳුනා ගැනීම මෙම සාකච්ඡාව සඳහා ප්‍රායෝගිකව ප්‍රයෝජනවත් වනු ඇත. විශේෂයෙන්ම ආගමික සංස්ථාව නූතන ලොව සෑම රාජ්‍යයකම පාහේ දේශපාලන අධිකාරයන්ගේ ක්‍රියාකාරිත්වයට බලපෑම් එල්ල කරන යුගයක් එළඹ තිබෙන තත්කාලීන සමාජය තුළ ඒ පිළිබඳව අධ්‍යයනය කිරීම ඉතාමත් කාලෝචිත අවශ්‍යතාවයකි.

වර්තමාන සමාජය තුළ බොහෝ රාජ්‍යයන් ආගම සහ දේශපාලනය අතර පවතින සබඳතාව ව්‍යවස්ථානුකුල විධිවිධාන ඔස්සේ සම්මත කරගනිමින් ආගමික රාජ්‍ය ක්‍රමයක් පවත්වාගෙන යන අතර, අනෙකුත් රාජ්‍යයන් ආගමික රාජ්‍ය ක්‍රමයෙන් බැහැරව යමින් ලෞකික රාජ්‍ය ක්‍රමයක් පවත්වාගෙන යන ආකාරය දක්නට ලැබේ. මෙම ආගම සහ දේශපාලනය අතර පවතින සුවිශාල අන්තර් සබඳතාව

වර්තමානය වන විට ලොව බොහෝ රාජ්‍යයන් වල ජාතිය ගොඩනැගීම සම්බන්ධව නොයෙක් ගැටලුකාරී තත්ත්වයන් නිර්මාණය කර ඇති ආකාරයක් හඳුනාගත හැකිය. නිදසුන් වශයෙන් පකිස්ථානය, බංගලාදේශය, ඉරානය සහ නේපාලය වැනි රාජ්‍යයන් පෙන්වාදිය හැකිය. මෙම රාජ්‍යයන් ව්‍යවස්ථානුකූල විධිවිධාන ඔස්සේ ලෞකික රාජ්‍ය ක්‍රමයක් ස්ථාපිත කිරීම වෙනුවට, ආගමික රාජ්‍ය ක්‍රමයක් ස්ථාපිත කරමින් දේශපාලන සංස්ථාව සහ ආගමික සංස්ථාව අතර සෘජු සබඳතාවයක් පවතින බව නෛතිකවම තහවුරු කර තිබේ. 1973 පකිස්ථානු ව්‍යවස්ථාව ඉස්ලාම් ආගම මත පදනම්ව ආගමික රාජ්‍ය ක්‍රමයක් ස්ථාපිත කර තිබෙන අතර, රාජ්‍ය නායකයා ඉස්ලාම් ලබ්ධිකයෙකු විය යුතු බවට ව්‍යවස්ථාපිත විධිවිධාන සළසා තිබේ (http://www.pakistani.org/pakistan/constitututtion). මේ ආකාරයට පකිස්ථානය තුළ දේශපාලනය ආගමිකරණය වීමේ ප්‍රතිඵලයක් වශයෙන් පකිස්ථානය තුළ ජීවත් වන අනෙකුත් ආගමික කණ්ඩායම් වන හින්දු, ක්‍රිස්තියානි, සික් වැනි ආගමික කණ්ඩායම් අතර අවිශ්වාසය වර්ධනය වී ඇත. එම කණ්ඩායම් රජයට විරුද්ධව කැරළි ගසන තත්ත්වයට පත්ව ඇති අතර 1994 වර්ෂය තුළ සිදුවූ මෙවැනි කැරළි ගැසීම් හේතුවෙන් 1,600 පමණ පිරිසක් මිය ගොස් ඇත. මෙවැනි විරෝධතාවයන් නිසා ප්‍රජාතන්ත්‍රවාදී මැතිවරණයන් තුළින් බලයට පත්වන ආණ්ඩු වලට පකිස්ථානය තුළ පාලන බලය ගෙනයෑමට නොහැකි තත්ත්වයන් බොහෝ අවස්ථාවන් වල උද්ගත වේ. එම නිසාම පකිස්ථානු පාලනය නිරන්තරයෙන් හමුදා පාලනය යටතට පත්වන ආකාරයක් හඳුනාගත හැකි වේ (හඳරාගම, 2014). ශ්‍රී ලංකාවේ ආගම සහ දේශපාලනය අතර සබඳතාවත්, භික්ෂු දේශපාලනය එම සබඳතාවට බලපෑම් කරන ආකාරයත්, අධ්‍යයනය කිරීම සඳහා පකිස්ථානය වැනි ව්‍යවස්ථාපිත ආගමික රාජ්‍යයන්හි දේශපාලන වාතාවරණය හඳුනාගැනීම අතිශයින්ම වැදගත් වන බව මේ අනුව පෙන්වාදිය හැකිය.

ඉහත සාකච්ඡාව තුළ සඳහන් කල පරිදි ආගමික රාජ්‍ය ක්‍රමයෙන් බැහැරව යමින් ලෞකික රාජ්‍ය ක්‍රමයක් පවත්වාගෙන යන සමහර රාජ්‍යයන්, ව්‍යවස්ථානුකූල විධිවිධාන ඔස්සේ ආගමික රාජ්‍ය ක්‍රමයෙන් බැහැරව ලෞකික රාජ්‍ය ක්‍රමයක් ස්ථාපිත කළත්, ක්‍රියාකාරිත්වයේදී ආගම සහ දේශපාලනය අතර පවතින සබඳතාව වර්ධනය වී ඇති ආකාරය දක්නට ලැබේ. ඇමරිකා එක්සත් ජනපදය, ඉන්දියාව සහ බ්‍රිතාන්‍ය වැනි වැනි රාජ්‍යයන් මේ සඳහා නිදසුන් ලෙස පෙන්වාදිය හැකිය. ඇමරිකා එක්සත් ජනපදය තම ව්‍යවස්ථානුකූල විධිවිධාන ඔස්සේ කිසිදු ආගමකට විශේෂ වරප්‍රසාද තම රාජ්‍ය ක්‍රමය තුළ ලබා නොදෙන බව දක්වා ඇති අතර, ඇමරිකා එක්සත් ජනපදය තුළ ක්‍රිස්තියානි, යුදෙව්, ඉස්ලාම්, හින්දු සහ බෞද්ධ යන ආගම් දක්නට ලැබේ. ලෞකික රාජ්‍ය ක්‍රමයක් ස්ථාපිත කර තිබුණද ඇමරිකානු සමාජය තුළ ප්‍රායෝගික තලයේ දක්නට ලැබෙනුයේ, ක්‍රිස්තියානි ආගම සහ දේශපාලනය අතර සුවිශාල සබඳතාවක් පවතින බවයි. දේශපාලනමය තීන්දු තීරණ ගැනීමේදී ක්‍රිස්තියානි පල්ලියේ සහ පූජකවරුන්ගේ බලපෑම වර්ධනය වී ඇති ආකාරයක් හඳුනාගත හැකිය. එමෙන්ම ඇමරිකා එක්සත් ජනපදය ව්‍යවස්ථාමය අනාගමික රාජ්‍යයක් වුවත්, ඇමරිකා ජනපති ධූරයට පත්වන පුද්ගලයා නිල වශයෙන් තම ධූරයේ වැඩකටයුතු ආරම්භ කිරීමට ප්‍රථමව බයිබලය මත අත තබා දිවුරුම් දීම වැනි සිදුවීම් හරහා ගම්‍යමාන වන්නේ එවැනි රාජ්‍යයන්ගේ දේශපාලන ක්ෂේත්‍රය තුළද වක්‍ර වශයෙන් හෝ ආගමික බලපෑම පවතින බවයි.

මේ ආකාරයට විමසා බැලීමේදී ආසියාතික රාජ්‍යයන් පමණක් නොව බටහිර රාජ්‍යයන් තුළද ආගම සහ දේශපාලනය එකිනෙකින් වෙන්කළ නොහැකි ලෙස අවියෝජනීය සබඳතාවයකින් යුතුව

ක්‍රියාත්මක වන බව පෙන්වාදිය හැකිය. විශේෂයෙන්ම ආසියාතික සමාජයක් වන ශ්‍රී ලාංකේය සමාජය තුළ මෙම අන්තර් සබඳතාව ඉතාමත් පැහැදිළිව හඳුනාගත හැකිය. පෙර සඳහන් කල ආකාරයට පකිස්ථානු 1973 ව්‍යවස්ථාවේ ඉස්ලාම් ආගම මත පදනම් වූ දේශපාලන රටාව වැනිම ස්වභාවයක් ශ්‍රී ලංකාවේ 1947, 1972 සහ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන් වල හඳුනාගත හැකිය. මෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන් සම්පාදනයේදී ආගම, භාෂාව සහ ජනවාර්ගිකත්වය වැනි විෂමතාවයන්ට ප්‍රමුඛස්ථානය ලබා දීමේ ප්‍රතිඵලයක් වශයෙන් දශක තුනකටත් එහා ගිය භයානක ප්‍රතිවිපාක ලබාදුන් ජනවාර්ගික යුද්ධයකටද මුහුණ දීමට සිදු විය. 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන පරිච්ඡේදයේ 6 වන වගන්තිය මඟින් ශ්‍රී ලංකාවේ ජනරජය බුද්ධාගමට ප්‍රමුඛස්ථානය පිරිනමන්නේ යැයි සඳහන් කර තිබේ (සෝමරත්න, 2014: 138). මේ අනුව පෙනී යන්නේ බෞද්ධාගමට ප්‍රමුඛස්ථානය ලබා දීම අසමානතාවයෙන් යුතුව සැළකීම පිලිබඳ ආකල්පයන් අනෙකුත් ආගම් අතර මුල්බැස ගැනීමට හේතු වී ඇති බවයි.

ශ්‍රී ලංකාව යටත්විජිතවාදී බලපෑමෙන් නිදහස් වීමත් සමඟම මුහුණ දුන් ප්‍රධානතම අභියෝගය වන ජාතිය ගොඩනැඟීමේ අභියෝගය වර්තමාන ශ්‍රී ලාංකික සමාජය තුළද ජයග්‍රහණය නොකළ අභියෝගයක් ලෙසින් පවතින බව ඉහත සාකච්ඡාව ආසුරින් විද්‍යමාන වේ. ශ්‍රී ලාංකේය දේශපාලනයේ විකාශය දෙස බැලීමේදී පැහැදිළිවම පිළිඹිබු වන කරුණක් වන්නේ බහු ආගමික සහ බහු වාර්ගික ජන කොටස්වල ආශාවන් සමෝධානය (Intergration) කර ගන්නා වූ ජාතිය ගොඩනැඟීමේ ප්‍රතිපත්තියකට ගමන් කරනවාට වඩා එම ආශාවන් විභේදනය කරන්නා වූ සමග්‍රහන (Assimilation) ප්‍රතිපත්තියක් ඔස්සේ ගමන් කරන බවයි. ජනවාර්ගික කොටස්වල විවිධත්වය මඟින් ඇති කරගන්නා දේශපාලන ඒකාග්‍රතාව වෙනුවට බොහෝවිට සුළු ජාතීන්ට හෝ බහු ජාතීන්ට විශේෂීකරණය වූ ප්‍රතිපත්ති සම්පාදනය කර තිබෙන ආකාරයක් ඉතිහාසය පුරාවටම ප්‍රතිපත්ති සම්පාදනය කර තිබෙන ආකාරය නිරීක්ෂණය කිරීමේදී හඳුනාගත හැකිය. එහි භයානකම ප්‍රතිඵලය වී ඇත්තේ ලාංකික දේශපාලන ක්‍රමය අසංවර්ධිත දිශානතියක් කරා යොමුව තිබීමයි. නමුත් මෙම තත්ත්වයට වගකිවයුත්තන් ලෙස මෙරට ප්‍රතිපත්ති සම්පාදකයින් වෙත පමණක් ඍජුවම චෝදනා එල්ල කල නොහැක. ප්‍රතිපත්ති සම්පාදකයින් පමණක් නොව විවිධ ආගම් ලබ්ධිකයින්, භාෂාවන් සහ සිරිත් විරිත් අදහන ලාංකික මහජනතාවද එහි වගකීම සමසේ භාරගත යුතු බව පෙන්වාදිය හැකිය.

ඉතිහාසයේ සිටම බහු වාර්ගික සහ බහු ආගමික සමාජයක් ලෙස පැවතුන ශ්‍රී ලාංකීය සමාජයේ සියලුම වාර්ගික සහ ආගමික කණ්ඩායම් කිසිදු භේදයකින් තොරව ජීවත් වී තිබේ. පෘතුග්‍රීසි, ලන්දේසි සහ ඉංග්‍රීසි ජාතිකයින්ට මෙරට යටත් වීමට පෙර ආගමික සංකල්ප හා බැඳුණු රාජ්‍ය පාලනය තුළ වර්තමානයේ දක්නට ලැබෙන ආකාරයේ පටු දේශපාලන අරමුණු නොවීය. ශ්‍රී ලංකාවේ පාලන බලය විදේශිකයින් අතට පත්වීමත් සමඟ මෙරට දේශපාලන ක්ෂේත්‍රය තුළ කතෝලික ආගමේ ව්‍යාප්තිය ආරම්භ වූ අතර බ්‍රිතාන්‍ය පාලන සමය තුළ මෙම තත්ත්වය බහුලව හඳුනාගත හැකිය. බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන්ගේ ප්‍රධානතම අරමුණක් වූයේ ක්‍රිස්තු ධර්මය ව්‍යාප්ත කිරීමයි. බටහිර සංස්කෘතිය ශ්‍රී ලංකාව තුළ ක්‍රමයෙන් ව්‍යාප්ත කරවීමේ ප්‍රතිඵලයක් ලෙස මිෂනාරි පාසල් තුළින් කතෝලිකකරණය ආරම්භ කරන ලදී. කතෝලිකකරණයේ ආරම්භයත් සමඟ දේශීය සංස්කෘතිය අනුව ගොඩනැඟී තිබූ සමාජ රටාවන් බිඳ වැටීමට ලක් විය. දේශීය අධ්‍යාපන ක්‍රම අභිබවා යමින් මිෂනාරි අධ්‍යාපන රටාව

ව්‍යාප්ත වී ඇත. 1868 වන විට කතෝලික නොවන එනම් බෞද්ධ, හින්දු, මුස්ලිම් හෝ වෙනත් ගනයෙහිලා සැළකිය හැකි එකදු පාසලක්වත් නොතිබුණි (හඳරාගම, 2014).

යටත්විජිත පාලන කටයුතු වල පහසුව සඳහා ආගම යොදා ගැනීම මෙරට තුළ පසුකාලීනව ආගම හා දේශපාලනය අතර අනිසි සබඳතා ගොඩනැගීමට ඍජුවම බලපාන ලදි. දේශීය ආගම්වලට ප්‍රතිවිරුද්ධව ගොඩනැගෙන ලද මෙම ක්‍රියාකාරකම්වලට එරෙහිව ආගමික භේදයකින් තොරව බෞද්ධ, හින්දු සහ ඉස්ලාම් ආගමිකයින් විවිධ ක්‍රියාමාර්ග ගත්තා ලදී. මිෂනාරිවරුන්ගේ ආගමික ප්‍රතිසංස්කරණ ව්‍යාපාරයට එරෙහිව නැගී සිටි සෑම ආගමක්ම නියෝජනය කල ගිහි පැවිදි දෙපිරිසම කටයුතු කරන ලද්දේ පොදුවේ දේශීය සංස්කෘතිය ආරක්ෂා කරගැනීම සඳහා පමණක්ම වන බව ශ්‍රී ලාංකීය දේශපාලන ඉතිහාසය අධ්‍යයනය කිරීමේදී හඳුනාගත හැකිය. එම අවධිය තුළද භික්ෂුවගේ කාර්යභාරය දේශපාලනික ස්වරූපයක් ගනු ලැබුවත්, එය නූතන දේශපාලනීකරණය වූ කාර්යභාරයෙන් වෙනස් විය (Thambiah, 1992).

ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍ය පාලනයෙන් නිදහස දිනා ගන්නා යුගය වන විට මෙරට බටහිර සංස්කෘතිය මනාව වැළඳගත් දේශීය නායක පංතියක් බිහි වී තිබුණි. එම නායකයින්ගේ දේශපාලන හැසිරීම මෙරට ජාතික සමඟියට එතරම් හිතකර නොවීය. ඔවුන් තම දේශපාලන අරමුණු මුදුන්පත් කර ගැනීම සඳහා ජාති ආගම්, කුල වශයෙන් ජනතාව තුළ භේදභින්නතා ඇති කරන ලදි. යටත්විජිත යුගය තුළ හින්දු, මුස්ලිම්, බෞද්ධ ලෙස නොව ශ්‍රී ලාංකිකයින් ලෙස පොදුවේ අධිරාජ්‍යවාදී පාලනයට එරෙහි වූවෝ පසුකාලීනව තම ආගම, තම භාෂාව, තම ජාතිය යන පටු අදහස් මත පිහිටා කටයුතු කරන තත්ත්වයට පත් වීම වර්තමානයේ ශ්‍රී ලාංකිකයින් වශයෙන් අප මුහුණපාන ජාතිය ගොඩනැගීමේ අභියෝගයට මූලික හේතුව වශයෙන් පෙන්වා දිය හැකිය. 1928 ඩොනමෝර් කොමිසමේ නිර්දේශයන් මත 1931 මෙරටට සර්වජන ඡන්ද බලය හිමි වීමත් සමඟ බෞද්ධ භික්ෂුවගේ දේශපාලන සබඳතා ක්‍රමයෙන් වර්ධනය වූ ආකාරයක් හඳුනාගත හැකිය. එනම් භික්ෂුව මැතිවරණයන්ට ඉදිරිපත් නොවූවද, වක්‍රාකාරයෙන් මැතිවරණ දේශපාලනය හා සම්බන්ධ වී ඇති බව, 1931 රාජ්‍ය මන්ත්‍රණ සභා මැතිවරණයට ඉදිරිපත් වූ ඉංග්‍රීසි සංස්කෘතිය තුළ හැදී වැඩුණු ප්‍රභූ අපේක්ෂකයින් සහ සාමාන්‍යය ගැමි ජනතාව අතර සම්බන්ධීකරණය භික්ෂූන් වහන්සේලා මාර්ගයෙන් සිදුවීම තුළින් පැහැදිළි වේ (අයිවන්, 2006). වර්තමානය වන විට බෞද්ධ භික්ෂූන් වහන්සේලා දේශපාලන පක්ෂ පිහිටුවා ගනිමින් මැතිවරණ ජයගනිමින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වශයෙන් ඍජුවම දේශපාලන ක්‍රියාවලියට සහභාගී වන ආකාරයක් දක්නට ලැබේ. මෙම භික්ෂු දේශපාලනයේ හිතකර අත්දැකීමක් වශයෙන්, LTTE සංවිධානයට එරෙහිව රජය දියත් කළ මානුෂිය මෙහෙයුමේදී බෞද්ධ භික්ෂූන්ගෙන් සමන්විත වූ ජාතික හෙළ උරුමය නම් පක්ෂය තිරය පිටිපස සිටිමින් සිදු කල කාර්යභාරය දැක්විය හැකිය. නමුත් භික්ෂූන් වහන්සේලා අනවශ්‍ය ලෙස දේශපාලනයට මැදිහත්වීමේ අමිහිරි අත්දැකීම් රාශියක් ශ්‍රී ලාංකික දේශපාලන ඉතිහාසය තුළ පැහැදිළිවම හඳුනාගත හැකිය.

### 4.1. ශ්‍රී ලාංකීය භික්ෂු දේශපාලනයේ ආරම්භය සහ විකාශය

ශ්‍රී ලාංකීය භික්ෂුව දේශපාලන කටයුතු වලට සම්බන්ධ වීමේ ඉතිහාසය අතීත රාජාණ්ඩු පාලන සමය දක්වාම දිව යන්නකි. රට තුළ ඇතිවන අභ්‍යන්තර දේශපාලන අර්බුධයන්, සතුරු ආක්‍රමණ, යුධමය තත්ත්වයන් වලදී රාජ්‍ය පාලන කටයුතු නිවැරදිව සිදු කරගෙන යෑම සඳහා රජුට අවශ්‍යය

අනුශාසනාවන් ලබාදෙන ලද්දේ බෞද්ධ භික්ෂූන් වහන්සේලා විසින් බව ශ්‍රී ලාංකික ඉතිහාසය අධ්‍යයනය කිරීමේදී හඳුනාගත හැකිය. ඒ සඳහා සුදුසුම උදාහරණය වශයෙන් එළාර රජු සහ දුටුගැමුණු රජු අතර පැවති යුද්ධයේදී පවා දුටුගැමුණු රජුට අනුශාසකත්වය ලබා දීම බෞද්ධ භික්ෂූන් වහන්සේලා විසින් සිදු කර තිබීමත්, ඒ තුළින්ද රාජ්‍යත්වය කෙරෙහි ඇති කල බෞද්ධ ආගමික බලපෑම දක්නට ලැබීමත් පෙන්වා දිය හැකිය. නමුත් අතීත රාජාණ්ඩු පාලන අවධීන් තුළ දක්නට ලැබෙන භික්ෂු දේශපාලන ක්‍රියාවලිය වත්මන් භික්ෂු දේශපාලන ක්‍රියාවලියට වඩා හාත්පසින්ම වෙනස් ස්වරූපයක් ගන්නා බව පැහැදිළිවම හඳුනාගත හැකිය.

ලාංකීය සමාජයෙහි භික්ෂු දේශපාලනයේ ස්වරූපය සමාජ ගතිකයන් සමඟින් විවිධාකාර වෙනස්කම් වලට ලක්වූ අතර, එය කාලීන සමාජ අවශ්‍යතා පදනම් කරගනිමින් සමාජ ගැටලු සඳහා විසඳුමක් ලෙස සාර්ව තලය තුළ තම බලාධිකාරය පතුරුවන ආකාරයක් වර්තමානය වන විට දක්නට ලැබේ. නමුත් භික්ෂු දේශපාලනය හරහා පතුරවන මෙම බලාධිකාරය ඇතැම් අවස්ථාවන් වලදී සාර්ව තලයේ දේශපාලනය තුළ ගැටලු රැසකට මඟ පාදන්නක් වී තිබෙන බව භික්ෂු දේශපාලනයේ විකාශය අධ්‍යයනය කිරීමේදී පැහැදිළි වෙයි. ඉහත සාකච්ඡා කළ පරිදි මේ සඳහා අවශ්‍ය පදනම සපයන ලද්දේ යටත්විජිත යුගය සහ පශ්චාත් යටත්විජිත යුගය තුළ වර්ධනය වූ ජනවාර්ගිකත්වය මත පදනම් වූ ආකල්පයන් බව පැවසීම සාධාරණය.

ඉහත සඳහන් කල පරිදි යටත්විජිත යුගයේ බ්‍රිතාන්‍යයන් ගෙන ගිය බෙදා පාලනය කිරීමේ ප්‍රතිපත්තියේ මූලික අරමුණ වූයේ තමන්ට එරෙහිව ශ්‍රී ලාංකිකයින් නැඟී සිටීම වැළැක්වීම සඳහා පියවර ගැනීමයි. එනම් ආගමික සහ ජනවාර්ගික කණ්ඩායම් අතර අවිශ්වාසය වර්ධනය කිරීමේ අරමුණින් බ්‍රිතාන්‍යයන් විසින් එක් කණ්ඩායමකට නොමැති විශේෂ වරප්‍රසාද තවත් කණ්ඩායමකට ලබාදෙන ලදි. ඒ අනුව 1833 සිට 1947 දක්වා හඳුන්වා දෙන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ඔස්සේ සුළු ජාතීන්ට සුළු ජාතිකත්වය පිළිබඳ හැඟීම්ද මහ ජාතියට මහ ජාතිකත්වය පිළිබඳ හැඟීමද වර්ධනය වන ආකාරයට ප්‍රතිසංස්කරණ ඇති කරන ලදී. ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ඔස්සේ සුළු ජාතික රැකවරණය සඳහා බව සෘජුවම පෙන්වා දෙමින් යම් යම් ක්‍රියාමාර්ග හඳුන්වා දීමේ ප්‍රවණතාවක් වර්ධනය වී ඇති අතර, ඒවා හරහා මහ ජාතිය වන සිංහල බෞද්ධයින් තුළ අනෙකුත් සුළු ජන කණ්ඩායම් කෙරෙහි අවිශ්වාසයක් වර්ධනය කළ අතර අනෙක් අතට සුළු ජාතික කණ්ඩායම් තුළ මහ ජාතික සමාජ ප්‍රවාහයෙන් ආරක්ෂා විය යුතු යැයි හැඟීමක් ජනිත කරවන ලදි. මෙම සුළු ජාතික හැඟීම තව තවත් වර්ධනය කරවමින් යටත්විජිත නායකත්වය විසින් දේශීය සිංහල බෞද්ධ නායකත්වය වෙතට සමාජ, ආර්ථික, දේශපාලනික බලතල පැවරීම මහ ජාතිය කෙරෙහි සුළු ජාතික අවිශ්වාසය තවදුරටත් ස්ථාපිත කරන ලදි. මේ ආකාරයට ජනවාර්ගික කණ්ඩායම් අතර අවිශ්වාසය වර්ධනය වීම නිසා ශ්‍රී ලාංකික ප්‍රජාව වශයෙන් ඒකාබද්ධව අධිරාජ්‍යවාදී පාලනයට එරෙහිව නැඟී සිටි බෞද්ධ, හින්දු සහ ඉස්ලාම් නායකත්වය පසුකාලීනව ආගම, භාෂාව වැනි පටු සාධක තම දේශපාලන අරමුණු බවට පත්කර ගනිමින් ඔවුනොවුන් අතර බල අරගලයක නිරත වීම ආරම්භ වී තිබෙන බවට ලාංකීය දේශපාලන ඉතිහාසය සාක්ෂි දරයි. තම දේශපාලන අභිලාෂයන් ඉටු කරගැනීම සඳහා ජනවාර්ගික කණ්ඩායම් ගෙන ගිය ක්‍රියාකලාපය පසුකාලීනව සිංහල බෞද්ධ භික්ෂුව දේශපාලන වේදිකාව වෙත ගෙන ඒම දක්වාම වර්ධනය විය.

භික්ෂු දේශපාලනය මහත් ආන්දෝලනයට තුඩු දුන් අවස්ථාවක් ලෙස, 1946 ජනවාරි මාසයේ පැවති දේශපාලන රැස්වීම් වලදී ඩී. එස්. සේනානායක මහතා විසින් භික්ෂූන් වහන්සේලා දේශපාලනයේ නිරත වීම විවේචනය කිරීමට එරෙහිව ප්‍රසිද්ධියේ පිළිතුරු ලබා දෙමින් වල්පොළ රාහුල හිමියන් විසින් සිදු කළ පහත ප්‍රකාශය පෙන්වා දිය හැකිය.

> "*භික්ෂු සංඝයා කැමති නම්, බුද්ධානුබුද්ධක විනය ශික්ෂා පද වෙනස් කර ගැනීමට බුදුරජාණන් වහන්සේගෙන් අවසර ලැබී තිබේ. එසේ නමුත් මේ දක්වා කිසිදු අවස්ථාවක ථෙරවාදී භික්ෂූන් විසින් විනය ශික්ෂාපද වෙනස් කළ බවක්, ඉතිහාසයෙන් ඔප්පු නොවේ. නමුත් බුද්ධ කාලයෙහි පැවති ආර්ථික, සාමාජික සහ දේශපාලන තත්ත්වයට වඩා අද තත්ත්වය වෙනස් වී තිබෙන බවත්, එහෙයින් එකල පැවති භික්ෂු ජීවිතයට වඩා අද භික්ෂු ජීවිතය වෙනස් වී තිබෙන බවත් පිළිගත යුතුය. අධ්‍යාපන, සමාජයීය, අමද්‍යප කටයුතු සහ සහනදායක කටයුතු වලට මූලිකවම සම්බන්ධ වෙමින් අදත් භික්ෂූන් වහන්සේ දැන හෝ නොදැන දේශපාලන කටයුතු වල යෙදී සිටිති. භික්ෂූන් දේශපාලන කටයුතු වල යෙදීම වරදකැයි අපි නොපිළිගනිමු*"
> (අයිවන්, 2007: 178-179).

අතීතයේ විවිධාකාර ලෙස භික්ෂුව දේශපාලනයට සම්බන්ධ වුවත් රාහුල හිමියන්ගේ ඉහත ප්‍රකාශය ඇතුළත් විද්‍යාලංකාර ප්‍රකාශනයට පෙර කිසිදු ප්‍රකාශනයකින් භික්ෂුව දේශපාලනයේ නිරතවීම පිළිගත්තේ හෝ සාධාරණීකරණය කළේ නැත. මේ නිසාම මෙම ප්‍රකාශය ශ්‍රී ලංකාව තුළ මහත් ආන්දෝලනයක් ඇති කළ අතර, මෙම ප්‍රකාශය මෙන්ම එය සම්මත කර ගැනීමට මුල්වූ දේශපාලන භික්ෂූන්ද, මහනායක හිමිවරු ඇතුලු භික්ෂූන් රැසකගේද, එකල පුවත්පත් සහ දේශපාලනඥයින් අතින්ද දැඩි විවේචනයට ලක්වී තිබේ.

මෙම විවේචන ක්‍රමයෙන් පහව යමින් 1956 වන විට බණ්ඩාරනායක මහතාගේ නායකත්වයෙන් යුත් මහජන එක්සත් පෙරමුණ ක්‍රියාත්මක කළ ඡන්ද ව්‍යාපාරය සඳහා භික්ෂූන් වහන්සේලා ක්‍රියාකාරීව සම්බන්ධ වී ඇති ආකාරය හඳුනාගත හැකිය. එහිදී සඟ, වෙද, ගුරු, ගොවි, කම්කරු යන පංචමහා බලවේගයේ ප්‍රධාන භූමිකාව භික්ෂුවට හිමි විය (Bond, 1988). භික්ෂූන් වහන්සේලා අනවශ්‍යය ලෙස දේශපාලනයට මැදිහත් වීමේ අමිහිරි අත්දැකීම් මෙම යුගය තුළ දක්නට ලැබුණි. කාලයක් භික්ෂූන් වහන්සේලාගේ දේශපාලන ගමන මහ ඉහළින් අගය කරන ලද අගමැති බණ්ඩාරනායක ඝාතනයට සම්බන්ධ වන්නේ තල්දූවේ සෝමාරාම නමැති භික්ෂුවයි. මෙම අගමැති ඝාතනය හේතුවෙන් භික්ෂුව දැඩි ලෙස සමාජය විසින් විවේචනය කරන්නට වීම හා එම කැළල මකා දැමීමේ අරමුණින් යුතුව නැවතත් සිරිමා බණ්ඩාරනායක ආණ්ඩුවට තල්පාවිල ශීලවංශ, දැවමොට්ටාවේ අමරවංශ වැනි භික්ෂූහු සිය පූර්ණ සහයෝගය දැක්වූහ (Thambiah, 1992).

ඉහත දක්වන ලද අදහස් වලට අනුව පෙන්වා දිය හැක්කේ, ශ්‍රී ලාංකික සමාජය තුළ පවතින දේශපාලන ප්‍රවාහය තුළ ප්‍රධානතම බලපෑම් කණ්ඩායමක් වශයෙන් බෞද්ධ භික්ෂූන් ක්‍රියාත්මක වන බවයි. ඒ අනුව බෞද්ධ භික්ෂූන්, අතීතයේ සිටම ලාංකීය දේශපාලන ප්‍රවාහයට බලපෑම් කරමින් මහජනතාවට හිතකර මෙන්ම අහිතකර තත්ත්වයන්ද නිර්මාණය කිරීමට මූලික වී තිබෙන ආකාරය

හඳුනාගත හැකිය. විශේෂයෙන් 1950-60 ගණන්වල සිට බලපෑම් කණ්ඩායමක් වශයෙන් බෞද්ධ භික්ෂුවගේ දේශපාලන ඇඟිලි ගැසීම් මෙරට ජනවාර්ගික සහජීවනය නැති කිරීමටද යම් ප්‍රමාණයකට හේතු සාධක වී තිබෙන බව දක්නට ලැබේ. 20 වන සියවස ආරම්භයත් සමඟ ඇරඹි සමස්ත ලංකා බෞද්ධ සම්මේලනයේ සහ තරුණ පුරුෂයින්ගේ බෞද්ධ සංගමයේ අරමුණ, බුද්ධාගම රාජ්‍ය ආගමක තත්ත්වයට පත් කිරීම ලෙස දැක්වීමට සිංහල නායකයින් පෙළඹවීම බෞද්ධ භික්ෂු කණ්ඩායම් වල බලපෑම හරහා සිදුවී තිබේ. අවිහිංසාවාදය ඇගයිය යුතු භික්ෂූන් වහන්සේලාගේ මෙම ක්‍රියාකලාපය ජනවාර්ගික කොටස් අතර අවිශ්වාසය සහ සැකය වර්ධනය කිරීමට සෘජුවම බලපෑම් කර ඇති බව ලාංකික දේශපාලන ඉතිහාසය විමසීමේදී පැහැදිළි වේ. එම වැරදි දේශනාවන් නිසා නොමඟට ගිය රාජ්‍ය පාලනය වර්තමානයේද නිවැරදි කරගත නොහැකිව තිබේ (Bond,1998; Thambiah,1992). බහුවාර්ගික ශ්‍රී ලාංකික සමාජයේ සියලුම ජන කොටස් වලට ගෞරව කරන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් නිර්මාණය කරගැනීමට පාලක කණ්ඩායම් මේ දක්වාම අසමත් වීමට, ලාංකීය බෞද්ධ භික්ෂුවගේ දේශපාලන සහභාගීත්වය යම්තාක් දුරකට බලපෑම් කර තිබෙන බව මේ අනුව පෙන්වාදිය හැකිය.

### 4.2. ශ්‍රී ලාංකික භික්ෂූන් වහන්සේලා සංවිධානාත්මක ලෙස ක්‍රියාකාරී දේශපාලනයට සම්බන්ධ වීම සාර්ව දේශපාලන තලය තුළ බලපෑම් කළ ආකාරය

වර්තමාන ශ්‍රී ලාංකික සමාජය තුළ ආගම සහ දේශපාලනය අතර පවතින සබඳතාව පිලිබඳ සාකච්ඡා කිරීමේදී දක්නට ලැබෙනුයේ ආගම යන්න පොදු සමාජගත සංස්ථාවක් ලෙසට ගෙන එමඟින් ලෞකික පාලනය අර්ථවත් කර ගැනීමට පාලක පාලිත දෙපිරිසට කරනු ලබන දේශනා පිළිබඳව නොවේ.සැබවින්ම සිදුවන්නේ දේශපාලන වශයෙන් බලපෑම් සහගත කණ්ඩායමකගේ බලලෝභී ආශාවන් මුදුන් පමුණුවා ගැනීම සඳහා ආගම යොදා ගැනීම බව ශ්‍රී ලාංකේය දේශපාලන ක්ෂේත්‍රය තුළින් පිළිඹිබු වේ. නමුත් ආගම අන්තවාදී ලෙසට ශ්‍රී ලාංකික සමාජය තුළ ක්‍රියාකරනු විනා ආගමික සහජීවනය මෑත ඉතිහාසය තුළ හඳුනාගත නොහැකි වී තිබේ. ඇතැම් අවස්ථාවල ගිහි නායකයින් දේශපාලන තීරණවලදී නොමඟ යැවීමටද ආගමික නායකයින්ගේ ක්‍රියාකාරිත්වය බලපෑම් කර ඇති ආකාරය දක්නට ලැබේ.

භික්ෂූන් සංවිධානාත්මකව විශාල වශයෙන් පක්ෂ දේශපාලනයට සම්බන්ධ කරගත් වාමාංශික දේශපාලන පක්ෂය ලෙස ජනතා විමුක්ති පෙරමුණ පෙන්වා දිය හැකිය. 1971 සහ 1987-1989 ජවිපෙ කැරළි අවස්ථාවන්හිදී ජවිපෙ පාක්ෂිකයින් වූ භික්ෂු කණ්ඩායම් විසින් සැළකිය යුතු කාර්යභාරයක් ඉටු කරන ලදී. එමෙන්ම 1980 දශකයේ සිටම ජනතා විමුක්ති පෙරමුණෙහි දේශපාලන බලය නැංවීමෙහි ප්‍රධාන කාර්යභාරයක් බෞද්ධ භික්ෂූන් වහන්සේලා වෙත හිමිව තිබෙන බව ලංකාව පුරා පැතිරුණු ජවිපෙ භික්ෂු සංවිධාන ජාලය හරහා පැහැදිළි වේ. ජනතා විමුක්ති පෙරමුණ තුළ දේශප්‍රේමී භික්ෂු සංවිධානය, මානව හිතවාදී භික්ෂු සංවිධානය, සමස්ත ලංකා ප්‍රගතිශීලි භික්ෂු සංවිධානය සහ අන්තර් විශ්වවිද්‍යාල භික්ෂු බල මණ්ඩලය ආදී වශයෙන් රට පුරා පැතුරුණු භික්ෂු සංවිධාන ජාලයක් ජනතා විමුක්ති පෙරමුණ සතුව තිබීමෙන්ම මේ බව තහවුරු වේ. එසේම දේශපාලන පක්ෂයක් වශයෙන් ඉදිරියට ඒමත් සමඟ ජනතා විමුක්ති පෙරමුණ වර්තමානය වන විට, තම පක්ෂ සම්ප්‍රදායට බැහැරව යමින් මහා නායක හිමිවරුන් බැහැදැකීම වැනි කාර්යයන්හි නිරතවන ආකාරයක් පැහැදිළිවම

හඳුනාගත හැකිය. එයට හේතු වූයේ භික්ෂු සබඳතා හරහා ජනතා සහය තම පක්ෂයට ලබාගත හැකි බව ජවිපෙ නායකත්වය විසින්ද වටහා ගැනීම බව පෙන්වාදිය හැකිය (ප්‍රදීප්, 2011).

ඉහත සාකච්ඡාව අනුව භික්ෂූන් වහන්සේලා දේශපාලන පක්ෂ වලට සම්බන්ධ වෙමින් බලපෑම් කණ්ඩායමක් වශයෙන් ක්‍රියාත්මක වී ඇති බව හඳුනාගත හැකිය. 1940 දශකයේ පමණ සිටම භික්ෂුව දේශපාලන ක්ෂේත්‍රයේ විවිධාකාරයෙන් ක්‍රියාකාරීවූවත් මැතිවරණ සඳහා ඉදිරිපත්ව ඇත්තේ අවස්ථා කිහිපයකදී පමණි. භික්ෂූන් මැතිවරණ සඳහා ඉදිරිපත් වූ සෑම අවස්ථාවකදීම පාහේ විශාල ආන්දෝලනයක් ඇති කිරීමට හේතු වුවත් අවස්ථා කිහිපයකදී භික්ෂූන් පළාත් පාලන මැතිවරණ වලට ඉදිරිපත් වී ජයග්‍රහණ ලබා ඇත. උඩවත්තේ නන්ද හිමි මහනුවර මහනගර සභාවේ නාගරික මන්ත්‍රීවරයෙකු ලෙස තේරීපත්වීම නිදසුනක් ලෙස පෙන්වා දිය හැකිය. 2000 වසරේ පාර්ලිමේන්තු සභිකත්වය ලැබූ පළමු භික්ෂුව ලෙස බද්දේගම සමිත හිමියන් තේරීපත්ව තිබේ (ප්‍රදීප්, 2011).

ශ්‍රී ලාංකික භික්ෂු දේශපාලන ඉතිහාසයේ ප්‍රථම වරට භික්ෂු අපේක්ෂකයින්ගෙන් පමණක් සමන්විත ජාතික හෙළ උරුමය 2004 අප්‍රේල් 02 පාර්ලිමේන්තු මැතිවරණය ආසන්නයේ බිහිවී ඇත. ඉතා කෙටි කාලයකින් සංවිධානය වී මැතිවරණය සඳහා අපේක්ෂක භික්ෂූන් 260 ක් පමණ ඉදිරිපත් කරන ලදි. මෙහි විශේෂත්වය වූයේ මෙම පක්ෂය බෞද්ධ චාරිත්‍රයන්ට මුල් තැන දෙන මැතිවරණ ප්‍රචාරණ ව්‍යාපාරයක් දියත් කිරීමයි. එමෙන්ම මැතිවරණ ව්‍යාපාරය තුළ පක්ෂයේ දේශපාලන සළකුණ වූ හක්ගෙඩියට වඩා බෞද්ධ කොඩිය, ධර්ම චක්‍රය ආදිය භාවිතා කර තිබෙන ආකාරයක් හඳුනාගත හැකිය. එම මැතිවරණයේදී ජාතික හෙළ උරුමය ඡන්ද 554,724 ක් (5.97%) ලබා පාර්ලිමේන්තු ආසන 9 කට හිමිකම් කියන ලදී (ප්‍රදීප්, 2011).

කෙටි කලකින් සංවිධානය වී ජාතික හෙළ උරුමය ලැබූ ජයග්‍රහණය සැලකිය යුතු මට්ටමක එකක් වුවත්, මෙලෙස භික්ෂූන් පක්ෂ දේශපාලනයට පැමිණීම ලාංකික සමාජ තලය තුල ගැටලු රාශියකට මඟ පාදන්නක් වී තිබෙන බව සාකච්ඡා කල හැකිය.

**5. නිගමනය**

වර්තමාන ලෝකයේ බොහෝ රාජ්‍යයන්හි ආගම සහ දේශපාලනය අතර පවතින සබඳතාව පිළිබඳව සාකච්ඡා කිරීමේදී දක්නට ලැබෙනුයේ ආගම යන්න පොදු සමාජ සංස්ථාවක් ලෙස ගෙන එමඟින් ලෞකික පාලන රටාවන් අර්ථවත් කර ගැනීම සඳහා පාලක පාලිත දෙපිරිසට අවවාද අනුශාසනා කරන ක්‍රියාවලියක් නම් නොවේ. සැබැවින්ම සිදුවන්නේ දේශපාලන වශයෙන් බලපෑම් සහගත කණ්ඩායමකගේ බලලෝභී ආශාවන් මුදුන් පමුණුවා ගැනීම සඳහා ආගම යොදාගන්නා ආකාරයයි. ශ්‍රී ලංකාව සම්බන්ධයෙන්ද එම ප්‍රකාශය සත්‍යය වේ. ශ්‍රී ලාංකික භික්ෂුව නිදහසට පෙර යුගයේදී දේශපාලන ක්‍රමයේ සංවර්ධනයට, මහජන සුභසාධනයට විශාල සේවයක් සිදු කර තිබෙන බව අවිවාදයෙන්ම පිළිගත යුතු සත්‍යයක් වන නමුත්, වර්තමානයේදී ප්‍රභූ අවශ්‍යතා සපුරාලීම වෙනුවෙන් බෞද්ධ භික්ෂූන් වැඩි වශයෙන් පෙනී සිටින බව පිළිගත යුතුමය. ශ්‍රී ලාංකික ක්‍රමයේ වර්ධනයට අවශ්‍ය හෝ අනවශ්‍ය සෑම තීරණයකදීම බුද්ධිගෝචර විමසීමකින් තොරව භික්ෂූන් වහන්සේලා දේශපාලන බලය අතට ගැනීමට යෑම නිසා ශ්‍රී ලාංකික අනන්‍යතාවයට බාහිර සහ අභ්‍යන්තර වශයෙන් කැළැල් රාශියක් ඇතිවී තිබෙන ආකාරය හඳුනාගත හැකිය. බෞද්ධ භික්ෂුව රටේ දේශපාලන පක්ෂවලට පක්ෂග්‍රාහී වී දේශපාලනීකරණය වීම නිසා සාමාන්‍ය මිනිසුන් අතර

විහාරස්ථානය කෙරෙහි පැවති අපක්ෂපාති හා සාධාරණ ආකල්පය විනාශ වී තිබේ. බෞද්ධ භික්ෂූන්ගේ දේශපාලන මතිමතාන්තර ප්‍රතික්ෂේප කරන ජනතාව විහාරස්ථානයද ප්‍රතික්ෂේප කරන තත්ත්වයට පත් වීම, ශ්‍රී ලාංකික දේශපාලන ක්‍රමයට මෙන්ම බුදු දහමටද අනර්ථයන් රාශියක් ගෙන දීමට හේතු වී තිබෙන බව අවසන් වශයෙන් නිගමනය කළ හැකිය.

**6. ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**


අමරසේකර, දයා. සහ දසනායක, රෝහිත. 2004. ***ඉඳුවර පර්යේෂණාත්මක ලේඛන සංග්‍රහයඃ සමාජ විද්‍යාව II*** (ආගම සහ සමාජයඃ සමාජ මානව විද්‍යාඥයින් දස දෙනෙකුගේ චින්තාවන් පිලිබඳ විග්‍රහාත්මක හැඳින්වීමක්). වරකාපොලඃ ආරිය ප්‍රකාශකයෝ.

අයිවන්, වික්ටර්. 2006. ශ්‍රී ලංකාවේ නූතන කැරලිකරුවන්ගේ සමාජ පසුබිම. කොළඹඃ ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

අයිවන්, වික්ටර්. 2007. ***පන්සලේ විප්ලවයඃ බෞද්ධ පුනරුදය ගංගොඩවිල සෝම හිමි දක්වා.*** කොළඹඃ රාවය ප්‍රකාශකයෝ.

නමසිවායම්, එස්. 2005. ***ලංකාවේ ව්‍යවස්ථාදායක සභා.*** කොළඹඃ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

ප්‍රදීප්, එච්. යූ. එස්. 2011. ***"ශ්‍රී ලංකාවේ භික්ෂූන්ගේ දේශපාලන සබඳතා" සම්භාෂා.*** 17 කලාපය. 2009/10. කොළඹඃ අධ්‍යාපන අමාත්‍යාංශය

සෝමරත්න, විජේසිරි. 2014. ***ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම විකාශනය.*** කොළඹඃ ඇම්. ඩී. ගුණසේන (පුද්ගලික) සමාගම.

හඳරාගම, සමන්. 2014. දේශපාලන සමාජ විද්‍යාව. බත්තරමුල්ලඃ සමීර ප්‍රකාශකයෝ.

Almond, G. 1992. ***The Blackwell Encyclopedia of Political Science*** (Ed) Vernon Bogdanor. Oxford: IJF U.K.

Bond, George. D. 1998. ***The Buddhist Revival in Sri Lanka: Religious Tradition Reinterpretation and Response***. Columbia: University of South Carolina Press.

Department of census and statistics. 2011. ***Population and Housing Census Report – 2010***. Colombo: Department of census and statistics

Jayawardena, Kumari. 1986. ***Feminism and Nationalism in the Third World***. London: Zed Books.

Thambiah, S. J. 1992. ***Buddhism Betrayed: Religion, Politics and Violence in Sri Lanka***. London: University of Chicago Press.

(http://www.pakistani.org/pakistan/constitututION (Accessed on 16.01.2020)